ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
வங்கியல்லா நிதியியல் நிறுவனங்களின் மேற்பார்வைத் திணைக்களம்
DEPARTMENT OF SUPERVISION OF NON-BANK FINANCIAL INSTITUTIONS

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

**යොමු අංකය: 24/10/001/0019/005**

2023 පෙබරවාරි 02

ප්‍රධාන විධායක නිලධාරීන්
බලපත්‍රලාභී මුදල් සමාගම්

මහත්මයාණනි/ මහත්මියනි

**පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස ඉක්රා ලංකා ලිමිටඩ් (ICRA Lanka Limited) ඉවත් කිරීම**

මෙය 2018.03.13 දිනැති ණය ශ්‍රේණිගත කිරීම් පිළිබඳ 2018 අංක 01 දරන චක්‍රලේඛය හා සබැඳෙයි.

පහත අත්සන් කළ අය වෙත ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇති පරිදි, ඉක්රා ලංකා ලිමිටඩ් විසින් ශ්‍රී ලංකාව තුළ එහි ව්‍යාපාර කටයුතු 2023.01.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි නවත්වන අතර, ඒ අනුව එහි සේවාලාභීන් වෙත අදාළ ගිවිසුම් යටතේ නිකුත් කරන ලද ශ්‍රේණිගත කිරීම් ද එදින සිට ම බලපැවැත්වෙන පරිදි ඉවත් කරගනු ලැබේ.

එබැවින්, ඉක්රා ලංකා ලිමිටඩ් වෙතින් සේවාවන් ලබා ගෙන ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත පහත අත්සන් කළ අය විසින් දැනුම් දෙනු ලබනුයේ බලපත්‍රලාභී මුදල් සමාගම්වලට අදාළ වන රෙගුලාසි සමග අනුකූල වීම සඳහා හැකි ඉක්මනින්, පිළිගත හැකි වෙනත් ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයක් සමග අලුත් ගිවිසුම්වලට එළඹෙන ලෙස සහ ඒ සම්බන්ධව පහත අත්සන් කළ අය දැනුවත් කරන ලෙසත්ය.

මෙම ලිපියේ අඩංගු කරුණු 2023.02.02 සිට බලපැවැත්වෙන අතර, මෙය 2018 අංක 01 දරන ණය ශ්‍රේණිගත කිරීම් පිළිබඳ චක්‍රලේඛය සහ 2021 අංක 08 දරන පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයක් ලෙස ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් පිළිගැනීම පිළිබඳ චක්‍රලේඛය සමග කියවිය යුතු ය.

මීට විශ්වාසී,

ආර්. එම්. සී. එච්. කේ. ජයසිංහ මිය
**අධ්‍යක්ෂ**